Milestones

January to December, 2023

**Consular**

We have made regular engagements with the dept of Immigration & Immigration to address cases of consular issues related to issuance of passports, dual citizenship and information requests

**Trade & Investment**

OOSLA coordinates with Sri Lanka missions/posts abroad, OSLs and government stakeholders and agencies to identify potential investment opportunities in Sri Lanka, particularly small - Medium investments from OSLs. We have facilitated several OSLs entrepreneurs to get required support from our stakeholder agencies.

**EDUCATION & KNOWLEDGE SHARING INITIATIVES**

We thank the resource persons from our OSL communities around the world for their contribution on English language teaching cyber security, gastronomy & culinary art, Leadership etc, that benefited several hundreds of Sri Lankan students and instructors

**Philanthropy & Reconciliation**

philanthropic projects were identified with the collaboration of the Ministry of Home Affairs, District Secretariats. OSLs interested are invited to contact OOSLA for full details of these pilot projects and the modality of implementation.

## Contact Us


www.oosla.lk

oosla@presidentsoffice.lk

+94 706 984 146 (WhatsApp)
+94 114 351 154
Ext.5380/5383/5384/5385/5386

twitter.com/ooslalk

facebook.com/ooslasl

youtube.com/@OfficeforOverseasSriLankan

Visit us when you are in Sri Lanka next time:

Office for Overseas Sri Lankan Affairs
2nd floor,
Old Charted Bank Building,
Chatham Street ,
Colombo 01.


සබැඳි ශ්‍රී ලංකාවක්

CONNECTED SRI LANKA

இணைக்கும் இலங்கை

# OFFICE FOR OVERSEAS SRI LANKAN AFFAIRS

OOSLA

OFFICE FOR OVERSEAS SRI LANKAN AFFAIRS

# මාර්ග සිතියම

## 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

### ප්‍රදූත කටයුතු (කොන්සියුලර් සේවා)

විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම, ද්විත්ව පුරවැසිභාවය සහ තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන් වන කොන්සියුලර් ගැටලු 4335 කට අධික ප්‍රමාණයක් විසඳීම සඳහා, ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව සමඟ නිරන්තරව සම්බන්ධව සිටී.

### වෙළඳ සහ ආයෝජන

OOSLA විසින්, ශ්‍රී ලංකාව සඳහා විභව්‍ය ආයෝජන අවස්ථා හඳුනා ගැනීමේ අරමුණින් විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/තනතුරු, විදේශගත ශ්‍රී ලාංකිකයින්, රජයේ පාර්ශ්වකරුවන් සහ නියෝජ්‍යායතන සමඟ සම්බන්ධීකරණය සිදු කෙරේ. විදේශගත ශ්‍රී ලාංකිකයින් සමඟ සිදු කරන කුඩා හා මධ්‍යම පරිමාණ ආයෝජන සම්බන්ධ කටයුතු මේ අතර විශේෂ වේ.

DONATE

### අධ්‍යාපනික සහ දැනුම බෙදා ගැනීමේ වැඩසටහන

ශ්‍රී ලාංකික සිසුන් සිය ගණනකට සහ උපදේශකයින්ට ප්‍රතිලාභ ලබා දුන් ඉංග්‍රීසි භාෂාව, සයිබර් ආරක්ෂණය, ස්වාදු භෝජන කලාව (gastronomy) හා සූපශාස්ත්‍ර කලාව, නායකත්වය යනාදී දැනුම ලබා දීම සඳහා සිදු කරන දායකත්වය වෙනුවෙන් ලොව පුරා සිටින අපගේ විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ සිටින සම්පත් දායකයින් වෙත අපගේ ස්තුතිය පිරිනමමු.

### පරිත්‍යාග හා ප්‍රතිසන්ධාන කටයුතු

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි සහයෝගීතාවයෙන් පරිත්‍යාගික ව්‍යාපෘති පහක් හඳුනා ගෙන ඇත. මෙම නියමු ව්‍යාපෘති පිළිබඳ සම්පූර්ණ විස්තර සහ පරිත්‍යාග කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විමසීම සඳහා OOSLA හා සම්බන්ධ වන ලෙස ඒ සඳහා උනන්දුවක් දක්වන විදේශගත ශ්‍රී ලාංකිකයින් වෙත ආරාධනා කෙරේ.

### අමතන්න


www.oosla.lk

oosla@presidentsoffice.lk

+94 706 984 146 (WhatsApp)
+94 114 351 154
Ext.5380/5383/5384/5385/5386

twitter.com/ooslalk

facebook.com/ooslasl

youtube.com/@OfficeforOverseasSriLankan

ඔබේ ඊළඟ ශ්‍රී ලංකා සංචාරයේ දී පැමිණෙන්න
විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ කටයුතු සඳහා කාර්යාලය
2 වැනි මහල පැරණි චාර්ටඩ් බැංකු ගොඩනැගිල්ල
වැතම් වීදිය
කොළඹ 01


සබැඳි ශ්‍රී ලංකාවක්
CONNECTED SRI LANKA
இணைக்கும் இலங்கை

# විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ කටයුතු සඳහා කාර්යාලය

OOSLA
OFFICE FOR OVERSEAS SRI LANKAN AFFAIRS

## About Us

OOSLA is a new institution established in January,2023 to be the central point for coordinating engagement with the overseas Sri Lankan population spread across the world.

OOSLA facilitates a two-way, multi-faceted interaction - It coordinates access to essential services provided by many institutions of the Government of Sri Lanka to the Overseas Sri Lankans. In the spirit of partnership, OOSLA embraces all OSLs and facilitates seamless engagement with Sri Lanka for them as investors, traders, tourists, philanthropists, resource persons or knowledge remitters, volunteers or as students interested to study in Sri Lanka

OOSLA serves as a your "one stop shop" for a mutually beneficial engagement with Sri Lanka.

### The Overseas Sri Lankans :

1. Non-Resident Sri Lankans (Sri Lankan citizens residing overseas)
2. Persons of Sri Lankan origin
   - Persons, who were Sri Lankan by birth or by registration and have subsequently obtained citizenship of another country ( naturalized)
   - Persons parents / grandparents (maternal / paternal) were Sri Lankan by birth
   - Dual citizens ( persons possessing foreign nationality and Sri Lankan nationality)

3. Foreign spouses of OSLs

## Our vision & Mission

Engage overseas Sri Lankans as key partners of Sri Lanka's progress in the global context and reconciliation.

To establish the most dynamic single stop institutional gateway for the overseas Sri Lankans (OSLs) that facilitates efficient delivery of services and access to all useful information, and to help nurturing a trusted relationship with OSLs as partners in Sri Lanka's progress and reconciliation.

## What we do?

- provide space for trusted interaction with all OSLs to understand their needs,concerns and interests to support their home country/community.
- Intervene at policy level to expedite delivery of services including consular functions by the relevant government stakeholders.
- Facilitate individual requests regarding investment opportunities and guide OSLs to connect with the agencies mandated.
- Support networking for local professionals with OSL professionals and vise versa, and encourage knowledge sharing, collaborative research and support for skill development in Sri Lanka.
- Provide support for OSL Philanthropic activities and sharing information on immediately available project options, CSR projects by OSLs.
- Facilitate Programs on volunteering for social work
- Encourage visit home & bring a friend, familiarisation tours/ visits to Sri Lanka.
- Enhance dialogue and understanding on diversity through culture, education and awareness raising, paving the way for reconciliation.

## අප ගැන

OOSLA යනු ලොව පුරා විසිර සිටින විදෙස්ගත ශ්‍රී ලාංකික ජනතාව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම පිණිස, 2023 ජනවාරි මස ස්ථාපනය කරන ලද නව ආයතනයකි.

OOSLA විසින් ද්විත්ව-මාර්ග හා බහුවිධ අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සපයනු ලැබේ. එමගින්, ශ්‍රී ලංකා රජයේ පාර්ශවකාර ආයතන 23 කට අධික සංඛ්‍යාවක් විසින් එතෙර සිටින ශ්‍රී ලාංකිකයින් වෙත සපයන අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය සම්බන්ධීකරණය කරයි. OOSLA හවුල්කාරිත්ව සබඳතාව තුළින් සියලු විදෙස්ගත ශ්‍රී ලාංකික ප්‍රජාව ආවරණය කරන අතර ආයෝජකයින්, ව්‍යාපාරිකයින්, සංචාරකයින්, පරිත්‍යාගකරුවන්, සම්පත් දායකයින් හෝ දැනුම බෙදා හරින පුද්ගලයන්, ස්වේච්ඡා සේවකයන් හෝ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලැබීමට කැමත්තක් දක්වන සිසුන් ලෙස ඔවුන්ට ශ්‍රී ලංකාව සමඟ බාධාවකින් තොරව සම්බන්ධ වීම සඳහා පහසුකම් සපයයි.

ඔබ ශ්‍රී ලංකාව සමඟ සිදු කරන අන්‍යෝන්‍ය අර්ථදායී සම්බන්ධීකරණයන් සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස OOSLA ක්‍රියා කරනු ඇත.

## විදේශගත ශ්‍රී ලාංකිකයන්

1. අනේවාසික ශ්‍රී ලාංකිකයන් (විදේශ රටවල පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්)
2. ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයන්
   - උපතින් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික වූ සහ පසුව වෙනත් රටක පුරවැසිභාවය ලබා ගත් පුද්ගලයින් (වෙනත් රටක පුරවැසිභාවයට ඇතුළත් කළ)
   - දෙමව්පියන්ගෙන්/මුත්තනුවන් හෝ මිත්තණියගෙන් (මව/පියාගේ) කෙනෙකු උපතින් ශ්‍රී ලාංකිකවන පුද්ගලයින්
   - ද්විත්ව පුරවැසියන් (ශ්‍රී ලාංකික පුරවැසිභාවය සහිත විදේශ ජාතිකත්වය ඇති පුද්ගලයින්)
3. විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ විදේශීය කලත්‍රයන් (විවාහය පවතී නම් පමණක් හෝ වෛවාහක සම්බන්ධය තුළ දරුවන් සිටී නම්)

## අපගේ දැක්ම සහ මෙහෙවර

ගෝලීය සන්දර්භය සහ සංහිඳියාව තුළ ශ්‍රී ලාංකික ප්‍රගතියේ ප්‍රධාන හවුල්කරුවන් ලෙස එතෙර සිටින ශ්‍රී ලාංකිකයන් සම්බන්ධ කර ගැනීම.

විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා කාර්යක්ෂම සේවාවන් සැපයීම මෙන්ම සියලු ඵලදායී තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පහසුකම් සැලසීම පිණිස වඩාත් ගතික, ඒකීය ආයතනික ද්වාරය ස්ථාපිත කිරීම සඳහාත්, ශ්‍රී ලංකාවේ ප්‍රගතියෙහි හවුල්කරුවන් ලෙස විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සමඟින් විශ්වසනීය සබඳතාවයක් පෝෂණය කිරීම සඳහාත් උපකාරී වීම.

## අපගේ කාර්යයන්

- සිය මව් රට/ප්‍රජාවට සහාය වීම පිණිස ඔවුන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් අවබෝධ කර ගැනීම සඳහා සියලුම විදේශගත ශ්‍රී ලාංකිකයින් සමඟ විශ්වාසදායක අන්තර්ක්‍රියා සඳහා ඉඩකඩ සලසා දීම.
- අදාළ රජයේ පාර්ශ්වකරුවන් විසින් ඉටු කරනු ලබන කොන්සියුලර් කාර්යයන් ඇතුළු සේවාවන් කඩිනම් කිරීම සඳහා ප්‍රතිපත්ති මට්ටමින් මැදිහත් වීම
- ආයෝජන අවස්ථා සම්බන්ධයෙන් තනි පුද්ගල ඉල්ලීම් පහසු කිරීම සහ විදේශගත ශ්‍රී ලාංකිකයින්ට මග පෙන්වීම.
- විදේශගත ශ්‍රී ලාංකික වෘත්තිකයන් සහ දේශීය වෘත්තිකයන් අතර ජාලයක් ඇති කිරීම සඳහා සහාය වීම සහ දැනුම බෙදාගැනීම, සහයෝගී පර්යේෂණ සිදු කිරීම සහ කුසලතා සංවර්ධනය සඳහා සහාය වීම දිරිගැන්වීම.
- විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ පරිත්‍යාගශීලී ක්‍රියාකාරකම් සඳහා සහාය ලබා දීම සහ විදේශගත ශ්‍රී ලාංකිකයින් මගින් නොපමාව ලබා ගත හැකි ව්‍යාපෘති විකල්ප, ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘති පිළිබඳ තොරතුරු බෙදාගැනීම.
- සමාජීය ක්‍රියාකාරකම් සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීමේ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම
- නිවෙස වෙත පැමිණීම හා මිතුරෙකු ගෙන්වා ගැනීම සඳහා දිරිගැන්වීම, ශ්‍රී ලංකා චාරිකාවන්/සංචාරයන් හුරුකිරීම.
- ප්‍රතිසන්ධානය අරමුණු කරගනිමින්, සංස්කෘතික, අධ්‍යාපනික, දැනුවත් කිරීම් හා සම්බන්ධ ක්‍රියාකාරකම් හරහා විවිධත්වය පිළිබඳ සංවාදය මෙන්ම අවබෝධය වැඩි දියුණු කිරීම.